

# සුදාරගේ සුමියුරු සිහල ජන ගී ප්‍රසංගය නැවතත්.... !

මෙරටට සංක්‍රමණය වී සිටින අපගේ දෙවන පරපුර වන අපගේ දූ දරුවන් පිළිබඳව සිතනා කල ඇතිවන්නේ ආහ්ලාදයක් ම යි. ඔවුහු අධ්‍යාපනයෙන් විකුම් පාති. රැකියාවල හොඳින් නියැලී ඉදිරියට යති. ක්‍රීඩාවලින් දස්කම් පාති. කලා කටයුතුවල නිරත වෙමින් සිය හැකියාවන් පෙන්වති. මේ සියල්ල අතරින් අප දකිනා ප්‍රධාන ම ලක්‍ෂණය වන්නේ තමන් භාරගන්නා කාර්යය ඉහළින් ම කිරීමට ඔවුන් වන කැපවීමයි. ඒ අතින් ඔවුහු අපගේ පරපුරට වඩා ඉහළින් සිටිති. දෙවැනි වෙතොත් ඒ අත්දැකීම් අතින් හෝ පරිණත බවින් විය හැකියි. පරිණත බව නැතහොත් මුහුකුරා ගිය බව ලබා ගැනීමට කාලයක් අවශ්‍ය වුවද, යමක් ඉක්මණින් ග්‍රහණය කරගන්නෙකුට අඩු වයසකදීත් ඒ දේට ළංවිය හැකියි. වයස සැමවිටම බලනොපායි.

ඊට නිසදුනක් මෙල්බන් නුවරින් වෙයි. සුදාර ද සිල්වා පුතා තවමත් කුඩා දරුවෙකි. සිංහල ගී ගායනයේදී ඔහුගේ ළමා කම හෝ වයස ඔහුට මදි පාඩුවක් නොවූ සේය. ගැයීමට අපහසු පැරණි සිංහල ගී පහසුවෙන් ම සුදාර පුතා ගායනය කරනවා අප දැක ඇත්තේ වරක්, දෙවරක් නොවේ. සිංහල උච්චාරණයට අනුව ම ගැයීමට ඔහුට ඇති හැකියාව ඔහු ඉංග්‍රීසි පරිසරයක හැදෙන වැඩෙන දරුවකු බව අපට අමතක කරවයි. ගායනය සමඟින්ම නර්තනය හා රංගනය ද එක්වී තිබීම විශේෂයකි. සුදාර ගායනා ඉදිරිපත් කරන්නේ ප්‍රසාංගිකවයි. ඒ නිසාවෙන් ම ඔහුගේ ගායනය අසා සිටිය හැකි වන්නා සේ ම ඒ දෙස බලා සිටින්නට ද හැකි වෙයි. ඊට සුදාරගේ ප්‍රසන්න පෙණුම ද එක් වෙයි.

පසුගිය පෙබරවාරි මාසයේ දී සුදාර පුතනුවන්ගේ තවත් එක් විශේෂ හැකියාවක් පිළිබඳව සාක්‍ෂි දැරීමට අපි වාසනාවන්ත වූයෙමි. ඒ අපගේ සිංහල ජන ගායනය කිරීමේ හැකියාවයි. වෙනත් සංගීත ක්‍රමවේදයන් ඇසුර කළ ප්‍රවීණයින් අතර පවා හෙළ ජන ගී රසය දනවමින් ගැයිය හැකි අය ඇත්තේ කීප දෙනෙකි. වෙනත් සංගීත රටා වලට හුරු වූ කට හඬ, නිර්ව්‍යාජ හෙළ ගැමි හඬින් බැහැරව යයි. දෙවනුව අපගේ ජන ගී ඌරුවට ගැයීමේ රටාවෙන් ද ඉබේම ඔවුන්ගේ ගායන රටාව ඈත් වෙයි. තවමත් ළමා වියේ පසුවන සුදාරට මේ දේ බලපා නැති සේ ය. ඔහු සිය ගායනයන් ඉදිරිපත් කරන්නේ වචන ද මතකයේ තියාගෙනයි. " රියැලිටි" තරඟවල හති වැටෙමින් දුවනා අපගේ " ලිට්ල් ස්ටාර්"ලාට කදිම පාඩමකි ඔහු කියා දෙන්නේ.

"සුමියුරු සිහල ජන ගී" නමින් තමන් ගැයූ ජන ගී අංග 18 කින් සංගත තැටිය එළිදක්වමින් සුදාර ද සිල්වා ඇතුළු දරු පිරිස ඉදිරිපත් කළ ජන ගී ප්‍රසංගය සැබැවින් ම සෑම සිත් සතුටු කළ ප්‍රසංගයන් විය. ගැමි පරිසරය මවා පාමින් සිය පියාණන් වන නන්නදසිරි ද සිල්වා කලාකරුවා නිර්මාණය කළ වේදිකාව එකල කළ ළමා ජන ගී, ගායන, නර්තන හා රංගන මෙල්බන් නුවර සිංහල වේදිකාව තවත් පිය සටහනක් සළකුණු කිරීමට සමත් වීය. තුන් සරණේ කවි, විරිඳු, පතල් කවි, පාරු කවි, ප්‍රශස්ති, සැහැලි, වන්නම් හුදෙක්ම සංගත තැටියක් මතු නොව, ළමා ජන ගී ගායකයෙකු හා ප්‍රසාංගික හා නර්තන කුසලතාවයන්ගෙන් පරිපූර්ණ ළමා පිරිසක් ද එළි දැක්වීමක් වෙමින් මෙල්බන් කලා වේදිකා ඉතිහාසයට එක්වෙයි.

"සුමියුරු සිහල ජන ගී" ළමා ජනගී ප්‍රසංගය නැවත වරක් අගෝස්තු 16 වෙනිදා සවස 6.30ට "ක්‍රැන්බර්න් කොමියුනිටි සෙන්ටර්" හිදී පැවැත්වීමට සූදානම් වෙයි. චලංක අතලගේ සහ දිනේෂ් ඈපා නර්තනාචාර්යවරුන්ගේ නැටුම් නිර්මාණ ද ඇතුලත් ප්‍රසංගය මෙවර ඉදිරිපත් කරන්නේ තාල අසපුව නර්තන රංගායතනයයි. ප්‍රසංගය සඳහා ටිලාන් පෙරේරා, නිසල් කරවිට, සියෝදා ජයවර්ධන, නෙම්සර නයිවල අප්පුහාමිගේ, හසිත බණ්ඩාර යොමිත් හා අසබ මලවර ආරච්චිගේ, බ්‍රෙමිනි හා බ්‍රියානා ප්‍රනාන්දු යන දරු දැරියන්ගෙන් ලැබෙන දායකත්වය ඊට මහත් ආලෝකයක් වනු ඇත. මෙවර නව අංග වශයෙන් ගජභා වන්නමත්, පැල් කවි ගායනාත් එක්වන අතර ප්‍රසංගය ඉදිරිපත් කරන්නේ ශ්‍රීනාත් මද්දුමගේ රංගන ශිල්පියායි. නාලක වීරකෝන් ඇතුළු පිරිස සංගීතයෙන් ද, සුපින් බණ්ඩාර අලෝකකරණයෙන්ද, සුනන්ද කුරේ ශබ්ද පරිපාලනයෙන් ද මෙම සද්කාර්යයට දායක වනු ඇත.

තවත් මෙල්බන් ළමා හපනෙකුගේ හැකියාවන් විඳීමටත් ඔහුව දිරිමත් කර ආශිර්වාද කිරීමටත් අප ලබනා මහඟු අවස්තාවකි මේ. අපි ඔවුන්ට සුභ පතමු.

සටහන

සිසිර දිසානායක


